**ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් අරමුදල - 2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභ සඳහා ඇති ශුද්ධ වත්කම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ප්‍රතිලාභ සඳහා ඇති ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ විස්තරාත්මක තොරතුරුවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ අංක 1321/18 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ 14(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සහ

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදීයට අනුකූල නොවීම**

| නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව<br>--------------------- | අනුකූල නොවීම<br>------------- | කළමනාකරණයේ අදහස් දැක්වීම<br>------------------- | නිර්දේශය<br>--------- |
|---|---|---|---|
| 2003 දෙසැම්බර් 31 දිනැති අංක 1321/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි | | | |
| (අ) රීති 18 | (i)කම්කරු කොමසාරිස්වරයාගේ සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව අරමුදල විසින් 2015 වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේදී පිළිවෙළින් සියයට 15කින් සහ සියයට 10කින් විශ්‍රාම වැටුප් ගෙවීම වැඩි කර තිබුණු අතර සංශෝධන 2022 නොවැම්බර් 04 දක්වා ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කර නොතිබුණි. | 2015 සහ 2021 වර්ෂවල සිදු කරන ලද විශ්‍රාම වැටුප් ගෙවීම්වල වැඩිවීම් ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කිරීමට එකඟ වූ පරිදි සංශෝධිත රීති 23.2, 23.3 සහ 23.4 අනුව ලං.වි.ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදි. අමාත්‍යාංශය විසින් කරන ලද ඉල්ලීමට අනුව, 2022 ජූනි 22 වන දින සංශෝධිත රීතිවල නීති කෙටුම්පත ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීමට ගරු අමාත්‍යතුමාගේ නිර්දේශය සඳහා නැවත විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා ඇත. | විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතු අතර, සංශෝධන සඳහා නිසි අනුමැතිය ලබාගෙන විශ්‍රාම වැටුප් අරමුදලේ රීතිවලට සංශෝධන නීතිගත කිරීමට කටයුතු කළ යුතුය. |
| | (ii) කම්කරු කොමසාරිස්වරයාගේ සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව පිළිවෙලින් 2022 වර්ෂයේ දී සහ සමාලෝචිත වර්ෂයේ දී 2021 ජනවාරි සිට | 2022 ජනවාරි 28 දිනැති තීරණය අංක 22.04.46 දරන අධ්‍යක්ෂක මණ්ඩල තීරණයට අනුව, විශ්‍රාම වැටුප් ගෙවීමේ 10% වැඩිවීම අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇත. | සංශෝධන සඳහා නිසි අනුමැතිය ලබාගෙන ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමෙන් සංශෝධන නීතිගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බලපැවැත්වෙන පරිදි අරමුදල විසින් මසකට සියල්ල ඇතුළත් අවම මාසික විශ්‍රාම වැටුප් මුදල රු. 10,000 සිට රු 15,000 දක්වා සහ 2020 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර විශ්‍රාමලත් විශ්‍රාමිකයින් සඳහා විශ්‍රාම වැටුප් සියයට 10කින් වැඩිකර තිබුණු අතර සංශෝධන 2022 නොවැම්බර් 04 දින දක්වා ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කර නොතිබුණි. | 2021 සැප්තැම්බර් 28 දිනැති තීරණ අංක 21.16.301 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, සියල්ල ඇතුළත් අවම මාසික විශ්‍රාම වැටුප වැඩිකිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. | |
| **(ආ)** රීති 23.2 | අරමුදලෙන් දීමනා නොගෙවිය යුතු වුවද, ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකට අනුව කම්කරු කොමසාරිස්වරයගේ සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ඇතිව පිළිවෙලින් 2018, 2019, 2020 සහ 2021 වර්ෂ සඳහා වෛද්‍ය දීමනා ලෙස රු. මිලියන 123,.5, රු. මිලියන 132.7, රු.මිලියන 142 සහ රු.මිලියන 150.7ක් ගෙවා තිබුණි. | 2003 දෙසැම්බර් 31 දිනැති අංක 1321/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 23.1 සහ 23.2 රීති ප්‍රතිස්ථාපනය කිරීමට යටත්ව 2013-10-23 දින එහි පැවති රැස්වීමේදී විශ්‍රාම වැටුප් අරමුදලේ භාරකරු ලෙස ලංකා විදුලිබල මණ්ඩයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද ලංවිම විශ්‍රාම වැටුප් අරමුදලේ 23.2, 23.3 සහ 23.4 සංශෝධිත රීති ප්‍රකාරව 2018, 2019, 2020 සහ 2021 යන වර්ෂවල ලංවිම විශ්‍රාම වැටුප් අරමුදලෙන් විශ්‍රාමලත් විශ්‍රාමිකයින් වෙත වෛද්‍ය දීමනාවක් ලබාදී ඇත. සංශෝධන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේ පවතී. | විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතු අතර ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමෙන් සංශෝධන නීතිගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

සමාලෝචිත වර්ෂයේ බදු ගෙවීමෙන් පසු අරමුදලේ ශුද්ධ වැඩිවීම රු. මිලියන 1,079ක් සහ ඊට අනුරූපව පෙර වර්ෂයේ බදු ගෙවීමෙන් පසු අරමුදලේ ශුද්ධ වැඩිවීම රු. මිලියන 1,246කි. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ මිලියන 167ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළ විශ්‍රාම වැටුප් ගෙවීම වැඩිවීම සහ පොලී ආදායම අඩුවීම පිරිහීමට හේතුවිය.

2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 39,248 ක අනාගත වගකීම් පියවීමට අදාළව, පෙර වර්ෂයේ ඌනතාවයට සාපේක්ෂව සියයට 11.08ක වැඩිවීමක් පෙන්නුම් කරමින් රු. මිලියන 14,226ක ඌනතාවයක් ඇති බව නිරීක්ෂණය වේ. තවද, 2021 වර්ෂය තුළ වැටුප් මට්ටම ඉහළ නැංවීම සහ වෛද්‍ය දීමනාව හඳුන්වාදීම වැනි විශ්‍රාම වැටුප් රීතිවල විධිවිධානවලට පටහැනිව විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වැඩිවීම් මෙම හිඟයට හේතු වී ඇති බව නිරීක්ෂණය විය. කෙසේවෙතත්, ඉහත ඌනතාවය ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කිරීම මගින් විශ්‍රාම වැටුප් අරමුදල එහි ශුද්ධ වත්කම් ඉහල නංවා ඇත.

## 2.2 ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම්වල ප්‍රවනතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමයන් පෙර වර්ෂය හා සැසඳීමේදී වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟ විශ්ලේෂණය පහත පරිදි වේ.

| ආදායම/ වියදම | 2021 | 2020 | වැඩිවීම / (අඩුවීම) | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| ආයෝජන ආදායම | 1,688,122,252 | 2,212,307,093 | (524,184,841) | (23.69) |
| විශ්‍රාමිකයින් වෙත ගෙවන ලද ප්‍රතිලාභ | 3,001,802,123 | 2,670,843,390 | 330,958,733 | 12.39 |